# බෞද්ධ පරිසර කළමනාකරණයේ නූතන උපයෝගීතාව

රන්ජනී මලවි පතිරණගේ[1]

## හැඳින්වීම

ස්වාභාවික පරිසරය හා මිනිසා අතර ඇත්තේ අවියෝජනීය සම්බන්ධතාවකි. එබැවින් මිනිසා පරිසරයට සිදු කරනු ලබන විනාශ කිරීම්වල ප්‍රතිවිපාක නැවත මිනිසාට ම අත්විඳින්නට සිදු වූ අවස්ථා බොහෝ ය. ඒ බව නූතන පාරිසරික ගැටලුවලින් සාක්ෂාත් වී ඇත. ජාත්‍යන්තර වශයෙන් පවා පාරිසරික නීති, සම්මේලන, සංවිධාන ගොඩනැගී ඇත්තේ මිනිසාගේ පැවැත්මට පරිසරය රැකගැනීම අත්‍යාවශ්‍ය සාධකයක් වී ඇති බැවිනි. අද දක්නට ලැබෙන පාරිසරික අර්බුදවලට විසඳුම් එදා බුදුරජාණන් වහන්සේ පෙන්වාදුන් ආකාරය බෞද්ධ සාහිත්‍ය මගින් හඳුනාගත හැකි ය. උන්වහන්සේ ස්වාභාවික පරිසරය වර්ණනා කළහ. තම ජීවිතයේ බොහෝ කාලයක් ස්වාභාවික පරිසරය ඇසුරෙහි ගතකළහ. පරිසර නීති භික්ෂූන් වහන්සේලාගේ විනය නීතිවලට පවා ඇතුළත් කළහ. පාරිසරික උපමා උපමේයයන් යොදා ගනිමින් ධර්මය විවරණය කළහ. පරිසරයට හානි කිරීමෙහි අහිතකර විපාක පෙන්වා දුන්හ. නිදසුනක් ලෙස ගසක අත්තක් හෝ කැපීම මිත්‍රද්‍රෝහී වීමක් බව පෙන්වා දීමෙන් ගස්වැල් ප්‍රාණීන් ලෙස සලකා ආරක්ෂා කළ යුතු බව පෙන්වා දී ඇත. එම උපදේශයන් නූතන පරිසර ගැටලු විසඳීමෙහිලා උපයෝගී කර ගැනීමට ද හැකියාව ඇත. පරිසරය සංරක්ෂණය සඳහා ක්‍රියා කිරීම, පරිසරය සෞන්දර්යාත්මකව අගය කිරීම, ස්වභාව ධර්මයේ යථාර්ථය පිළිගනිමින් එහි නීතීන් පරිසර කළමණාකරණයේ අපේක්ෂිත අරමුණු ලෙස හඳුනා ගැනීම, මිනිසා හා පරිසරය අතර බැඳීම වැඩි කිරීම, පරිසරය සම්බන්ධ ආචාර ධර්ම ඇගයීම හා ඇති කිරීම, පරිසරය ඇගයුම් සහ පුද්ගල මනස සංවර්ධනය කිරීම හා පරිසරය මිනිසාත් මිනිසා පරිසරයත් බව හඳුන්වා දීම ආදිය මෙහිදී විශේෂයෙන් වැදගත් වේ. එහෙත් ඒ පිළිබඳ බොහෝ පර්යේෂකයන්ගේ අවධානය යොමු වී නොමැත. එම ඌණතාව මගහරවා ගනිමින් පරිසරය කළමනාකරණය කර ගැනීමට අවැසි බොදු දසුන පිළිබඳ හඳුන්වා දීම මෙම පර්යේෂණ පත්‍රිකාව මගින් සිදු වේ.

මෙහි පර්යේෂණ ක්‍රමවේදය වනුයේ සාහිත්‍යය මූලාශ්‍ර අධ්‍යයනය යි. ප්‍රධාන වශයෙන් ම බෞද්ධ සාහිත්‍යය පිළිබඳව කරුණු අවධාරණය කළ යුතු බැවින් ත්‍රිපිටකය ඇතුළු ප්‍රාථමික මූලාශ්‍රය කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ. ඊට අමතරව මේ පිළිබඳව ලියවී ඇති ද්විතීයික, තෘතීයික ග්‍රන්ථ, වාර්තා හා

---

[1] සහකාර කථිකාචාර්ය, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය, mpranjanee@gmail.com.

සටහන් ආදියත්, අන්තර්ජාලය හා වෙබ් අඩවි ඔස්සේ ලබා ගත හැකි නවතම දත්ත හා තොරතුරු අධ්‍යයනයත් සිදුවේ.

## ප්‍රතිඵල

බුදුදහමට අනුව පාරිසරික අර්බුද ඇති නො වන ආකාරයට පරිසර කළමනාකරණය කර ගත යුතු ආකාරය හඳුන්වා දීමට හැකි වීම මෙමගින් අපේක්ෂිත ප්‍රධාන ප්‍රතිඵලය යි. පාරිසරික ගැටලු හඳුනා ගැනීමට හැකිවීම, ඒවාට බුදුදහමෙන් ලබා දිය හැකි විසඳුම් පෙන්වා දීමට හැකිවීම, නූතන කළමනාකරණ ක්ෂේත්‍රයට බෞද්ධ කළමනාකරණය තුළින් ගතහැකි ආදර්ශ පෙන්වා දීමට හැකිවීම හා මේ පිළිබඳ විමර්ශනශීලී අනාගත පර්යේෂකයන්ට ද එමගින් අත්වැලක් සැපයීමට හැකිවීම මෙම පර්යේෂණයේ අවශේෂ ප්‍රතිඵල ලෙස දැක්විය හැකි ය.

මෙම කරුණු සාක්ෂාත් කිරීම සඳහා සැකෙවින් නිදසුන් කිහිපයක් දැක්විය හැකි ය. සංයුත්ත නිකායේ වනරෝප සූත්‍රයේ පරිසර සංරක්ෂණය, මල්වතු උයන්වතු, වන වගා කිරීම තුළින් දිවා රාත්‍රී පින් වැඩෙන බවත් දිව්‍යමය සැප සම්පත් ලැබෙන බවත් දැක්වීමෙන් සමස්ත පරිසරය කමනාකරණය කර ගත යුතු ආකාරයත් එහි ප්‍රතිඵලත් පෙන්වා දී ඇත. එමෙන් ම දැනට විනාශ වී ගොස් ඇති පාරිසරික සම්පත් නැවත ඇති කර ගත යුතු බව විනාශ වෙමින් පවතින සම්පත් ප්‍රතිසංස්කරණය කළ යුතු බව ඒ සියල්ලට ම මූලිකත්වය ගන්නා අය ඊට සුදුස්සන් විය යුතු බව අංගුත්තර නිකායේ කුල සූත්‍රය ඇසුරින් පෙන්වා දිය හැකි ය. පාචිත්තිය පාලියේ භූතගාම ශික්ෂාපදය මගින් බීජ හා පැළෑටි පවා ජීවත්වන ප්‍රාණීන් සේ සළකා කටයුතු කළ යුතු බව දැක්වීමෙන් පැහැදිලි වන්නේ මිනිසා විසින් පරිසරය කෙරෙහි දැක්විය යුතු ආකල්ප සකස්විය යුතු ආකාරය යි. පාචිත්තිය පාලියෙහි ම පවිත්‍ර ජලයට කැලි කසළ ආදිය බැහැර නො කළ යුතු බව අවධාරණය කිරීමෙන් නූතන ලෝකයේ ඇති වී තිබෙන ජලය සම්බන්ධ ගැටලුවලට විසඳුමක් ලබාදේ. අංගුත්තර නිකායේ සප්ත වණිජ්ජා සූත්‍රය තුළින් සත්ත්ව වෙළඳාම, මාංශ වෙළඳාම හා විෂ ද්‍රව්‍ය වෙළඳාම නො කළ යුතු බවත් ඒවායේ ආදීනවත් පෙන්වා දීමෙන් පරිසර සම්පත් රාශියක සුරක්ෂිතභාවය තහවුරු කර ගැනීමට මං විවර කරයි. එම උපදෙස් ක්‍රියාත්මක කරන්නේ නම් වඳවී යන සතුන් ආරක්ෂා කර ගත හැකි ය. ජල ගෝලයට, පාංශු ගෝලයට හා වායු ගෝලයට විෂ වායු හා ද්‍රව්‍ය එකතුවීම වැළැක්විය හැකි ය. මෙත්ත සූත්‍රයේ එන විශ්ව මෛත්‍රී සංකල්පය ක්‍රියාත්මක කරන්නේ නම් ජීවී හා අජීවී සමස්ත පරිසරයට ම හිතවත් ආකල්පයක් දැරීමට පුද්ගල මනස පෙළඹවිය හැකි ය. එම ආකල්පය පුද්ගලයා පරිසරය ආරක්ෂා කිරීමට අභිප්‍රේරණය කරවීම නිසා එය පරිසර අර්බුදවලට විසඳුම් සෙවීමේ දී බෙහෙවින් වැදගත් වේ. මක්නිසාදයත් පරිසරය ආරක්ෂා කිරීමටත් පරිසර ගැටලුවලට විසඳුම් සෙවීමටත් අවශ්‍ය නම් පළමුව පුද්ගල

මනස පරිසර හිතකාමී මනසක් බවට පත් කිරීම කාලීන අවශ්‍යතාවක් බැවිනි. එය බුදුදහම තුළ මැනවින් සාකච්ඡා කර ඇති බවට ඉහත දැක්වූයේ නිදසුන් කිහිපයක් පමණි. එනිසා නූතන පරිසර ගැටලුවලට විසඳුම් රාශියක් බෞද්ධ පරිසර කළමනාකරණය මගින් පෙන්වා දී ඇති බව පැහැදිලි ය.

## සමාලෝචනය

නූතන ලෝකයේ පාරිසරික අර්බුද රාශියක් දැකිය හැකි ය. ඊට හේතුව නිසි ලෙස පරිසරය කළමනාකරණය නො කිරීම යි. එහෙත් සර්වකාලීනව ප්‍රායෝගික දර්ශනයක් වන බුදුදහම මගින් ඒ සඳහා ගත හැකි ක්‍රියාමාර්ග රාශියක් පෙන්වා දී ඇත. එම සදුපදේශයන් ක්‍රියාත්මක කිරීම තුළින් බෞද්ධ මූලධර්මයන්ට අනුකූලව පරිසරය කළමනාකරණය කොට ගෙන මිනිසාට හිතකර පරිසරයක් ගොඩනගා ගත හැකිවන අතර පරිසරය සංරක්ෂණය කර ගැනීමට ද හැකි ය. මේ නිසා පරිසර කලමනාකරණයත් මානව සංවර්ධනයත් අතර ඇත්තේ මනා සම්බන්ධතාවකි. බුදුදහමට අනුව මිනිසා හා පරිසරය අතර බැඳීම් ශක්තිමත් කිරීම තුළින් පරිසර හිතකාමී මානව සංවර්ධනයක් ගොඩනංවා ගත හැකි ය. එසේ ම අවමයෙන් තෘප්තිමත් වීමත් උපරිමය අතිරේකයක් කොට සැලකීමත් තුළින් පාරිසරික සම්පත් ආරක්ෂා කර ගත හැකි ය. එලෙස පරිසර කළමනාකරණයට අවැසි බෞද්ධ දාර්ශනික සංකල්ප අධ්‍යයනය තුළින් නිවැරදි පාරිසරික ප්‍රඥප්ති ගොඩනැගිය හැකි ය. පරිසරයේ පැවැත්ම මිනිසාගේ පැවැත්මට ද හේතු වේ. පරිසරය නිවැරදිව කළමනාකරණය කර ගැනීම ඒ සඳහා අත්‍යවශ්‍ය බව බුදුදහම තහවුරු කරන ලද ආකාරය ඉහත කරුණු ස්වල්පයක් වුව ද විද්‍යමාන වේ.

**ප්‍රමුඛ පද :** පරිසරය, ගැටලු, කළමනාකරණය, බුදුදහම

## ආශ්‍රිත ග්‍රන්ථ

*සංයුත්තනිකාය* 1, (2005). බුද්ධ ජයන්ති මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*ථෙරථෙරීගාථා පාළි.* (2005). බුද්ධ ජයන්ති මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*ධම්මපද පාළි.* (2005). බුද්ධ ජයන්ති මුද්‍රණය, දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*මහාවග්ග පාළි* 1, (2005). බුද්ධ ජයන්ති මුද්‍රණය, දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

පෙරේරා, ඉන්ද්‍රාණි. (2006). *කළමනාකරණ සංකල්ප.* බෞද්ධ ප්‍රවේශයක්, කතෘ ප්‍රකාශන.